ආරක්ෂාව

ශ්‍රී ලංකාවේ පස්වන විධායක ජනාධිපතිවරයා ලෙස මහින්ද රාජපක්ෂ මහතා පත්වූයේ උතුරු, නැගෙනහිර මෙන්ම දකුණෙන්ද එල්ල වූ සියලු අභියෝගයන් ජය ගනිමින්ය.

නොවැම්බර් 17 වැනිදා පැවති මෙම ජනාධිපතිවරණයෙන් සුළු ජාතීන්ගේ සහාය නොමැතිව දකුණේ ඡන්ද වලින් ජයග්‍රහණය කිරීමට මහින්ද රාජපක්ෂ මහතා ලද විශාල ජයග්‍රහණයක් විය.

මෙම ජනාධිපතිවරණය පැවැත්වීමට සති කිහිපයකට පෙර සිටම උතුරු, නැගෙනහිර දෙමළ ජනතාවට ඡන්දය වර්ධනය කරන්නැයි කොටි නියෝග කිරීම නිසා මෙවර එක්සත් ජාතික පක්ෂයට තිබූ එකම වාසියද අහිමි විය.

ඡන්දය වර්ජනය කරන්නට කොටි සංවිධානය ගත් තීරණය වෙනස් කරන ලෙස ඉල්ලා සිටීමට එක්සත් ජාතික පක්ෂය අවසාන මොහත දක්වා ගත් සියලු උත්සාහයන් ව්‍යාර්ථ වී ගියේය. දෙමළ සන්ධාන මන්ත්‍රීවරුන්ද කොටින්ගෙන් විවිධ ආකාරයෙන් ඉල්ලුම් කළද මෙවර කොටින්ගේ තීරණය වෙනස් නොවිණි. අවසාන මොහොතේ මේ සඳහා කොටි අවනත කරවා ගැනීමට වන්නි ගිය කඳුරට ජනතා පෙරමුණේ නායක පී. චන්ද්‍රසේකරන් ද කොටි දේශපාලන නායක තමිල් සෙල්වම්ගේ දෝෂ දර්ශනයට ලක්විය.

මේ සියලු ජවනිකා අවසානයේ උතුරු, නැගෙනහිර ඡන්දයෙන් එජාපය බලාපොරොත්තු වූ වාසි අත් නොවිණි. කොටි පාලන ප්‍රදේශවල සිටින වැසියන-ට ඡන්දය දැමීම තහනම් කළ කොටි සංවිධානය මාර්ගවල ටයර් පුළුස්සා අවහිර කළහ.

එම නිසා වන්නි කොටි පාලන ප්‍රදේශයේ සිට එකඳු ඡන්ද දායකයකුවත් පැමිණියේ නැත.

යාපනය, මූහමාලේ හමුදා මාර්ග බාධකය අසල යොදා තිබූ පොකුරු ඡන්ද මධ්‍යස්ථානයේ කිලිනොච්චි දිස්ත්‍රික්කයට අයත් ඡන්ද මධ්‍යස්ථාන 103 ක් පිහිටා තිබුණි. ඡන්ද දායකයන් 89,454 ක් කිලිනොච්චි දිස්ත්‍රික්කයට අයත් ලියා-පදිංචි ඡන්ද දායකයින් ලෙසින් මේවායේ ඡන්දය පාවිච්චි කිරීමට නියමිතව තිබිණි. ඡන්ද දිනයේ දහවල් 12.00 වනතුරුත් මෙම ඡන්ද මධ්‍යස්ථාන වෙත වන්නියෙ-න් කිසිවෙකුත් පැමිණියේ නැත. එහෙත් දහවල් 2.15 ට යාපනය රජයේ පාලන ප්‍රදේශයේ සිට පැමිණි දෙදෙනකු අතරින් කාන්තාවක් තම ඡන්දය හොර රහසේම ප්‍රකාශ කලාය. ඇය කිලිනොච්චියේ සිට කල්තියා යාපනයට පැමිණ සිටි පාසල් ගුරුවරියකි. තම සැමියා සමග පැමිණියත් සැමියා ඡන්දය දැමීමට බියවීම නිසා මෙම පාසල් ගුරුවරිය පමණක් ඡන්දය ප්‍රකාශ කළාය. එය කිලිනොච්චිය දිස්ත්‍රික්කයෙන් ප්‍රකාශයට පත්වූ එකම ඡන්දය වූ අතර මැතිවරණ ප්‍රතිඵල ගණන් කිරීමේදී එම එකම ඡන්දයද විපක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මහතාට ලබාදුන් බව හෙළිවිය. එහෙත් මූලතිව් දිස්ත්‍රික්කයේ ඡන්ද ප්‍රතිඵල ඊට වඩා හාත්පසින්ම වෙනස් විය. මූලතිව් දිස්ත්‍රික්කයට අයත් ඡන්ද මධ්‍යස්ථාන පිහිටියේ වව්නියාව, ඔමන්ත පොකුරු ඡන්ද මධ්‍යස්ථාන තුළය. කොටි පාලන ප්‍රදේශයෙන් කිසිවෙකුවත් පැමිණියේ නැත.

එනමුත් මූලතිව් දිස්ත්‍රික්කයට අයත් එකම සිංහල ගම්මානය වූ කිරිඉබන් වැව ගමේ වැසියන් 893 ක් ඡන්දය ප්‍රකාශ කළ අතර ඉන් වැඩිම ප්‍රතිශතය ලැබුණේ මහින්ද රාජපක්ෂ මහතාටය.

මේ සියලු කාරණා අවසානයේ මහින්ද රාජපක්ෂ මහතා සියලු බලවේග පරාජය

කරමින් ජනාධිපතිධුරයට පත්විය.

නව ජනාධිපතිවරයා පත්වීමත් සමග රටේ යුද්මය වාතාවරණයක් ඇතිවේ යැයි විවිධ බලවේග මතින් රටපුරා යුද බියක් ඇති කළද දකුණේ ජනතාව එම සියළු බලවේග පරදා නව ජනාධිපතිවරයා බලයට ගෙන ආවේය.

සාම සාකච්ඡා ආරම්භ කිරීම සම්බන්ධව පාර්ලිමේන්තුව නියෝජනය කරන සියළු දේශපාලන පක්ෂ සමග කඩිනමින් සාකච්ඡා කිරීමටද ජනාධිපතිවරයා පියවර ගත්තේය.

මේ අතරතුර වන්නි කොටි නායකත්වයේ කෘෂර පැසිපිස්ට්වාදී පාලනයෙන් මිදී දෙමළ ජනතාවගේ මූලික අයිතිවාසිකම් තහවුරු කර තිබෙන මෙම පාර්ශවය සමග එකතු වන ලෙස කරුණා පාර්ශ්වය උතුරු නැගෙනහිර කොටි සාමාජිකයන්ට දැනුම් දුන්නේය.

වන්නි කොටින්ගේ මහා විරු දින සැමරුම යෙදුනේද මේ අතරතුරදීය. මෙහිදී කොටි නායකයා කරන මහා වීර දින ප්‍රකාශය තීරණාත්මක විය හැකි බව කල්තියා අනතුරු හැඟව්වද එය බලාපොරොත්තු වූ තරම් ප්‍රබල කතාවක් නොවිය.

යුද බිමේ සෙන්පතියකු ලෙස ප්‍රකට සරත් ෆොන්සේකා මහතා පත්කිරීමත් සමග කොටි නායකත්වය පවා භීතියට පත්ව ඇත. ඒ ඔහු සටන් බිමේ පෙරමුණට ගොස් අණදෙමින් රිවිරැස, බලවේගය, ත්‍රිවිධබලය, යාල්දේවි ඇතුළු මෙහෙයුම් රැසකටම නායකත්වය දුන් දක්ෂ නිලධාරියෙකු නිසාය.

ආරක්ෂක අංශ පවසන්නේ කොටි නායකයා මෙවර කල ප්‍රකාශයද දියාරු ප්‍රකාශයක් බවය. නව ජනාධිපතිවරයා දෙමළ ජාතික අර්බුදය විසඳීම සඳහා අනුගමනය කරන වැඩපිළිවෙළ දෙස ඉවසීමෙන් බලා සිටින බව කොටි නායක ප්‍රභාකරන් මහා වීරුදින ප්‍රකාශයෙන් පැවසීය.

දසදහසක පමණ කොටි හමුදාවක් තබාගෙන මේ වනතෙක් රජයට අභියෝග කළ කොටි නායකයා සැර අඩු ප්‍රකාශයක් කිරීමට පෙළඹුනේ නව ජනාධිපතිවරයාගේ පත්වීමත් සමග විය හැකි බව ආරක්ෂක අංශවල මතයයි. ජාතික ආරක්ෂාව බිඳ වැටී සාම සාකච්ඡා ඇත සිටි මොහොතක ජනාධිපතිධුරයට පත්වූ මහින්ද රාජපක්ෂ මහතා මේ වනවිට ගනිමින් සිටින පියවර කාගේත් පැසසුමට ලක්ව ඇත.

යුද හමුදාව මානසිකව බිඳ වැටී ඇති මොහතක එම තත්ත්වයෙන් ගොඩ ගැනීම සඳහා හිටපු හමුදාපති ලුතිනන් ජනරාල් ශාන්ත කෝට්වෙගොඩ මහතාව ඉවත් කර ඒ වෙනුවට සටන් බිමේ අත්දැකීම් ඇති දක්ෂ නිලධාරියෙකු වන ලුතිනන් ජනරාල් සරත් ෆොන්සේකා මහතාට පත්කිරීමට නව ජනාධිපතිවරයා පියවර ගත්තේය.

යුද බිමේ සෙන්පතියකු ලෙස ප්‍රකට සරත් ෆොන්සේකා මහතා පත්කිරීමත් සමග කොටි නායකත්වය පවා භීතියට පත්ව ඇත. ඒ ඔහු සටන් බිමේ පෙරමුණට ගොස් අණදෙමින් රිවිරැස, බලවේගය, ත්‍රිවිධබලය, යාල්දේවි ඇතුළු මෙහෙයුම් රැසකටම නායකත්වය දුන් දක්ෂ නිලධාරියෙකු නිසාය.

කොටින්ගේ ඔනෑම අභියෝගයකට මුහුණදිය හැකි අයුරින් හමුදාව ශක්තිමත් කර තැබීමට ඔහු සූදානමින් සිටින්නේය. පසුගිය ඒජාප රජය සමයේ සටන් විරාම ගිවිසුමට අනුව යාපනයේ අධි ආරක්ෂිත කලාප ඉවත් කිරීමට දැඩි බලපෑම් එල්ල වෙද්දී අධි ආරක්ෂිත කලාප ඉවත් නොක-රීමේ දැඩි මතයක සිටිමින් අධි ආරක්ෂිත කලාප බෙරාගත් වීරයා වූයේද සරත් ෆොන්සේකා මහතාය. ඔහු විසින් මේ සම්බන්ධව සකස් කළ වාර්තාව අධි ආරක්ෂිත කලාප සම්බන්ධව සොයා බැලීමට පැමිණි ඉන්දීය ජනරාල් සතිස් නම්බියාර් මහතාගේ පැසසුමටද ලක්විය.

ශ්‍රී ලංකා රජයේ නව ජනාධිපතිවරයා ආරක්ෂක අංශ සීරුවෙන් තැබීමට ගත් මෙම පියවර සම්බන්ධව ආරක්ෂක අංශ තුළ පැසසුමට ලක්ව ඇත.

මේ වනවිට ආරක්ෂක ලේකම්වරයා වශයෙන් ද, සටන්බිමේ අත්දැකීම් ඇති දක්ෂ නිලධාරියෙකු වන කර්නල් (විශ්‍රාමික) ගෝඨාභය රාජපක්ෂ මහතාවද පත්කර තිබේ.

ත්‍රිවිධ හමුදාව ශක්තිමත් කරගෙන යන අතරතුරේ සාම සාකච්ඡා සම්බන්ධව ජනතාව තුළ බලාපොරොත්තුවක් ඇති කිරීමටද නව ජනාධිපතිවරයා පියවර ගත්තේය.

ශ්‍රී ලංකාවට ආධාර කළ මිත්‍රශීලී රාජ්‍යවල සහයෙන් සාම ක්‍රියාවලිය තවදුරටත් ඉදිරියට ගෙන යාමට තමා කැපවී කටයුතු කරන බව නව ජනාධිපතිවරයා රාජ්‍ය ත්‍රාන්තිකයන් හමුවේ ප්‍රකාශ කළේය.

මේ අනුව රජයේ සාම පණිවුඩය රැගත් සටන් විරාම නිරීක්ෂණ කමිටු ප්‍රධානියා සාම සාකච්ඡා කඩිනමින් ආරම්භ කිරීම සම්බන්ධව රජයේ පණිවුඩය රැගෙන ගොස් එල්.ටී.ටී.ඊ. යට දැනුම් දුන්නේය. ඒ දෙසැම්බර් 01 වැනිදාය.

සටන් විරාම ගිවිසුම සංශෝධනයට ලක්කිරීම සම්බන්ධව රජයේ තීරණය මෙහිදී දීර්ඝ ලෙස සාකච්ඡා කෙරිණි. එමෙන්ම සාම සාකච්ඡා යළි ඇරඹීම සම්බන්ධවත් කරුණා පිලේ නැගෙනහිර ප්‍රහාර නැවැත්වීම සම්බන්ධවත් දීර්ඝ ලෙස සාකච්ඡා වී තිබිණි.

කොටින්ට තවමත් ප්‍රධාන අර්බුදයක්ව පවතින කරුණා පිලේ තර්ජනය මැඩ පවත්වා ගැනීම සඳහා නව රජය යටතේද උත්සාහ කරන බව මෙමගින් පෙනීයයි. කරුණා පිල නැගෙනහිර පලාතේ ක්‍රියාත්මක වනතුරු තමන්ට ඊලාම් රාජ්‍යය දිනා ගැනීම සිහිනයක් බව දන්නා කොටි සංවිධානය නව රජය යටතේත් කරුණා පිල මැඩපැවැත්වීමට බලාපොරොත්තුවෙන් සිටී.

මේ සියළු කාරණා හරහා පෙනීයන්නේ කරුණා පිලේ තර්ජනය අවසන් වනතුරු මහා යුද මෙහෙයුමකට යෑමට කොටින්ට නොහැකි බවකි.

■

මහින්දට කොටි උදව් ලැබුණා ද?

කොටි ගැට මැද ජනපතිවරණය

ටී ආර් පෙරේරා

6 පිටෙන්

පහර දීම සඳහා සාඩ් ලා ගත් මරදාන පරණවාඩිය ජය බිමේ අක්කර හතරක ඇරඹෑ ආනන්දය, සිංහල බෞද්ධ දරුවන-'ට එහැන් පටන් ජය භූමියක් ම විය. පන් ආනන්ද ජවනිකා පොත වසමින් ඉතිහාස කතාව ඉවර කළා.

මහන්සියි 'වගේ නේද..? ඕල්කට් තුමාගේ පින්තූරයක් බලාගෙන ඇඳලා ඉවර කළා පින් ඇහුවා.

මේ ඉතිහාසය මහන්සි වෙලා ලිව්වෙ මෙයින් මෙහේ උදව්වයටත් ගන්න පාඩමේ තියෙන හන්දා... අපි මෙහේ මහා පෙරළියක් කරන්න ඒනෙ නැහැ.. ඒත් අපේ දේවව් ටික රැකගන්න හරි පොදු ආයතනයක් තියෙනවා නම් මොන තරම් හොඳඳ..? පන් කිව්වා.

දැනටත් ඉඩින් ඔය පන්සල් වල එහෙම ඔය වගේ දේවව් කෙරෙනවා.. පත්තර.. සංවිධාන එහෙමත් තියෙනවා.. මේ හැම දෙයක්ම සම්බඳධීකරණය කරන්න පුලුවන් ආයතනයක් තියෙනවා නම් හොඳයි තමා.. පින්, පන් ට එකග' වුණා.

■